# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,598 - 2009 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා - 2009.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 492 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 496 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

489 - B 080005 —9,125 (2009/04)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දූරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දූරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දූරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය — අනුරාධපුර

### මහෝපාධ්‍යාය ධුරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පිළිගත් විශ්වවිද්‍යාලයක බෞද්ධ අධ්‍යයනය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම ;
02. ප්‍රාචීන භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා තිබීම ;
03. උපසම්පදාව ලැබීමෙන් පසු වසර 20ක් සම්පූර්ණ කර තිබීම හා විනයධර භික්ෂූන් වහන්සේ නමක් වීම.

මහෝපාධ්‍යායයන් වහන්සේ වර්ෂ 03ක කාලයකට පත් කරනු ලබන අතර, උන්වහන්සේ විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු ද, ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියා ද වන්නේ ය. විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ වගකිව යුතුය. විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාලක සභාව විසින් ගනු ලබන තීරණ ද, අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් සනාතන සභාව විසින් ගනු ලබන තීරණ ද, ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උන්වහන්සේගේ වගකීම වන්නේ ය. 2009.07.07 වන දිනට වයස අවුරුදු 62කට නොවැඩි විය යුතුය. මහෝපාධ්‍යායයන් වහන්සේ වර්ෂ 03ක කාලසීමාවකට හෝ හැටපස් (65) වන විය සම්පූර්ණ කිරීම හෝ යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දැරිය හැකිය.

මහෝපාධ්‍යායයන් වහන්සේට රජය විසින් අනුමත කර ඇති වැටුප් හා අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. අයදුම්කාර භික්ෂූන් වහන්සේ විශ්වවිද්‍යාල පද්ධතියේ/රජයේ සේවයේ/සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු වන්නේ නම්, සිය ආයතන ප්‍රධානියා මඟින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, මෙම ධුරයට තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකි බව අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම වගන්තිය බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ භික්ෂූන් වහන්සේලාට අදාළ නොවේ. විශ්වවිද්‍යාලය තුළ නේවාසික පහසුකම් සපයනු ලැබේ.

මහෝපාධ්‍යාය තනතුරට පත් වූ විට ඉදිරි වර්ෂ 03 ක කාලය තුළ දී විශ්වවිද්‍යාලය සඳහා සිදු කිරීමට බලාපොරොත්තු වන මෙහෙවර දක්වන ලිපියක් සමඟ සවිස්තරව ජීව දත්ත දැක්වෙන ඉල්ලුම්පතක් පිළියෙල කොට ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය, නන්දන මාවත, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2009.04.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ “මහෝපාධ්‍යාය ධුරය සඳහා අයදුම්පත ” යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්.

2009 මාර්තු මස 18 වැනි දින,
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය,
නන්දන මාවත,
අනුරාධපුර.

04-326

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 මැයි මස 18 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 11 වැනි දින,
234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | කොළඹ | කොළඹ | අළුත්කඩේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12 |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| 02. කොළඹ | කොළඹ | නිව් බසාර් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12 |
| 03. කොළඹ | කොළඹ | මරදාන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12 |
| 04. කොළඹ | කොළඹ | මෝදර කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12 |
| 05. කොළඹ | කොළඹ | කොටහේන කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12 |

04-314

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

1. *(අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :-*

| | |
|---|---|
| හෙද සහායිකා - නිත්‍ය<br>දන්ත සහායිකා - නිත්‍ය | සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ. පෙළ.) විභාගයෙන් ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විද්‍යා විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකෙන අතර උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ. |
| පොලිස් කාන්තා - නිත්‍ය | සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. |
| සංගීතඥ (නැටුම් ශිල්පිනියන්/ ගායිකාවන්) - නිත්‍ය | සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. |
| නිල ඇඳුම් පරීක්ෂාකාරිනී - ස්වේච්ඡා | අ. පො. ස (සා/පෙළ) විභාගයට පෙනී සිටීම සහ ඕනෑම ඇඟලුම් ක්ෂේත්‍රයක අවම අවුරුද්දක පළපුරුද්දක් තිබීම, ඇඳුම් කැපීම, මැසීම, නිර්මාණය සහ ඕවලොක් යන්ත්‍රය ක්‍රියා කරවීමේ හැකියාව. |

*(ආ) අනෙකුත් සුදුසුකම් :-*

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

(1) *පුරවැසිභාවය* :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(2) *වයස* :- 2009 ජූලි මස 20 වැනි දිනට අවුරුදු 18ත් 22ත් අතර
2009 ජූලි මස 20 වැනි දිනට අවු. 18ත් 25ත් අතර
(නිත්‍ය) (ස්වේච්ඡා)
(3) *උස* :- අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතුයි.
(4) *බර* :- ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2} < 25$
(5) *වර්ණ දෘෂ්ටිය* : CP2
(6) *දෘෂ්ටි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)
(7) *සිවිල් තත්ත්වය* :-

(අ) *නිත්‍ය* - අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(ආ) *ස්වේච්ඡා* - අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගත වූ පසු විවාහ වීමට ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

2. පළමුවන ඡේදයේ ‘අ’ හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ ‘ආ’ හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

3. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. *සේවා කොන්දේසි :-*

(අ) ගුවන් කාන්තාවන් සේවයට බැඳුනුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත්, ඉන්පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශ රටක දී ඉටුකළ යුතුය.

5. *බඳවා ගැනීමේ කොන්දේසි :*

*නිත්‍ය :*

තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන පන්තියේ ගුවන් කාන්තා ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 05ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 07ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් කාන්තාවන්ට අවස්ථාව ඇත.

*ස්වේච්ඡා :*

තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන පන්තියේ ගුවන් කාන්තා ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන්ගේ මූලික බඳවා ගැනීමේ කාලය වසර 05කි. සේවා කාලය වසර 50ක උපරිම වයස් සීමාවක් දක්වා එක් එක් වතාවේ දී තවදුරටත් වසර 05 බැගින් වූ කාල සීමාවලින් සේවය දීර්ඝ කරනු ලැබිය හැකිය.

6. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :*

තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

7. *වැටුප් හා දීමනා :*

(අ) වසරකට ගුවන් කාන්තාවන්ට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ :

ගුවන් කාන්තා - රු. 1,66,560 - 7 x 1,440 - 19 x 1,800 = රු. 2,10,840
නායක ගුවන් කාන්තා - රු. 1,70,880 - 4 x 1,440 - 19 x 1,800 = රු. 2,10,840
කෝප්‍රල් රු. 1,75,200 - 1 x 1,440 - 10 x 1,800 - 9 x 2,510 = රු. 2,17,320
සැරයන් - රු. 1,80,240 - 3 x 1,800 - 9 x 2,520 - 3 x 3,480 = රු. 2,18,760
බලපන්ති සැරයන් - රු. 1,83,840 - 1 x 1,800 - 9 x 2,520 - 3 x 3,480 = රු. 2,18,760.
බලලත් නිලධාරිනි - රු. 2,11,800 - 13 x 3,480 = රු. 2,57,040.

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමානයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

(ආ) *දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 4,500 ක් ගෙවනු ලැබේ.
(2) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.
(3) ක්‍රියාත්විත සේවයේ සේවය කරන්නන් හට අතිරේක දුෂ්කර දීමනාව මසකට රු. 3,900 ක් ගෙවනු ලැබේ.
(4) *විශේෂ දීමනාව :* මසකට රු. 2,400 ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්).
(5) *දිරි දීමනා :* සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු. 850 දක්වා).
(6) *ආහාර දීමනා :* පිටත වාසය කරන ගුවන් කාන්තාවන්ට මසකට රු. 8,915.40 බැගින් ගෙවනු ලබන අතර කඳවුරු තුළ වාසය කරන ගුවන් කාන්තාවන්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.
(7) *නේවාසික පහසුකම් :* කඳවුරු තුළ වාසය කරන ගුවන් කාන්තාවන්ට නොමිලේ සපයනු ලැබේ.
(8) *ගමනාගමනය :* වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් කාන්තාව/ස්වාමිපුරුෂයා/ළමයින්ට) ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.
(9) *වික්ෂේපණ දීමනා :* මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණයද විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)
(10) *සුදුසුකම් වැටුප් :* ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50).
(11) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා :* මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තියන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා).
(12) *නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව :* මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.
(13) *නැවත සේවයට බැඳීමේ වැටුප් :* නැවත සේවයට බැඳෙන ගුවන් කාන්තාවන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.
(14) *වෛද්‍ය පහසුකම් :-* ගුවන් හමුදාව මගින් සෑම ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.
(15) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.
(16) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් කාන්තාවන්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුළී දීමනාවක් හිමි වේ.
(17) *උපදේශක දීමනාව :* මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමි වේ.
(18) *වෙනත් දීමනා :-* (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.
(19) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

8. *ඉල්ලුම්කාරියට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2009 අප්‍රේල් මස 30 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ "ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.). අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කාරියක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළ යුතු අතර වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණා වූ ද මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද, ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කාරිය තෝරාගනු ලැබුවහොත් ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද, ඒ සමඟ එවිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂිකාවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි :

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.) ;

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික ;

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික ;

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කාරිය ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය ;

(5) ක්‍රීඩා, ශිෂ්‍ය භට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කාරියන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමඟ නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

9. සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඒකල කඳවුරේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඇයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කාරියන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

12. අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඇයට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඇයගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේ ය.

13. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම :—————.
   (ජාතික හැඳුනුම්පතට අනුව)
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :—————.
4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :—————.
5. ස්ථිර ලිපිනය :—————.
6. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.
7. දිස්ත්‍රික්කය :—————.
8. මැතිවරණ කොට්ඨාසය :—————.
9. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :—————.
10. දුරකථන අංකය :—————.
11. උපන් දිනය :—————.
12. විවාහක/අවිවාහක බව :—————.
13. උස : අඩි :—————. අඟල් :—————.

14. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

15. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.

17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර :————.

18. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේදී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

21. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

22. ඉල්ලුම්කාරිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :————.

04-453

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වෙයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2009**

බලයලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වෙයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

(i) වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙළ කිරීම,
(ii) වැනි කොටස - පිඹුරු ඇඳීම.

2. විභාගයේ පළමුවැනි කොටස 2009 ජූනි මස 20 වැනි දින ද, දෙවැනි කොටස 2009 අගෝස්තු මස 22 හා 23 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවැනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත් වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහා වන සර්වෙයර් ජනරාල් ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේදී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය :

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට ;
(ආ) කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට.

4. පහත දැක්වෙන ආදර්ශය අනුව පිළියෙල කර ගත් අයදුම් පත්‍ර රු. 300.00 ක් වටිනා මුදල් ඇණවුමක් හෝ දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබාගත් රිසිට් පතක් සමඟ ජ්‍යෙ. මිනින්දෝරු අධිකාරි (විභාග), මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්නා "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වෙයර් ජනරාල් (මැනුම් පුහුණු ආයතනය)" ලෙස ද, ගෙවන කාර්යාලය "දියතලාව" ලෙසින් ද සඳහන් කළ යුතුය. එසේම රිසිට් පතේ මුල් පිටපත හෝ මුදල් ඇණවුමේ මුල් පිටපත අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. (කරුණාකර රිසිට් පත හෝ මුදල් ඇණවුම අයදුම් පත්‍රයේ අලවා නොඑවන්න.) කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස ස. ජ. ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2009" යනුවෙන් සඳහන් කරන්න. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

5. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

6. අයදුම්පත් 2009 මැයි මස 25 වැනි දින හෝ ඊට පෙර එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

7. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම් කරුවන් විසින් ඇඳීම් උපකරණද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදියද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණද රැගෙන ආ යුතුය. විභාග ශාලාධිපති ගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

8. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත,

(ආ) වලංගු ගමන් බල පත්‍රයක්,

(ඇ) විභාග පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්,

(ii) ඉහත 8(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

_________.

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
සර්වෙයර් ජනරාල්.

2009 මාර්තු මස 31 වැනි දින,
සර්වෙයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506, කොළඹ 05.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වෙයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2009

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම :_________. මයා/මිය/මෙනවිය.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :_________.
(iii) මුලකුරු සමග නම පැහැදිලිව ඉංග්‍රීසියෙන් :_________.
(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය :_________.
(ඇ) තනතුර :_________.
(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :_________.
(ඉ) ස්ථිර ලිපිනය :_________.
(ඊ) උපන් දිනය :_________.
(උ) අධ්‍යාපන සුදුසුකම් :_________.
(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :_______.
(එ) ගෙවන ලද ගාස්තු :_________.
(ඒ) මුදල් ඇණවුම්/රිසිට්පත් අංකය :_________.
නිකුත්කළ කාර්යාලය :_________.
දිනය :_________.

(ඔබ විසින් දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මගින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අමුණා එවිය යුතුය)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය තොරතුරු බව සහතික කරමි.

_________.

අයදුම්කරුගේ අත්සන.

දිනය :_________.

04-394

---

## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2009/2010

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය නව පරිශ්‍රය, දියගම, හෝමාගම ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය :*

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(අ) *නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)*

(i) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්ෂණය

*(ආ) අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (Set 2)*

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vi) පොලිමර් තාක්ෂණය
(vii) පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

2. *යෝග්‍යතාවය :*

2.1 *වයස :*

(අ) 2008.12.31 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2008.12.31 දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2006, 2007 හෝ 2008 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03ක් සමත්විය යුතුය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :*

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත). 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්ෂේත්‍රය :*

යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල :*

4.1 *අයදුම්පත් පෝරම :*

(i) *ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.*

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක :
http ://www.mrt.ac.lk/itum

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම - 2009/2010 " යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

"නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(iii) තම ලිපිනය ලියන ලද රු. 40 ක් වටිනා මුද්දර ඇල වූ අඟල් 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

(iv) අයදුම්පත සමඟ සහතිකවල මුල්පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතුය. (අයදුම්පතේ 03, 04 සහ 05 යන ඡේද බලන්න).

4.2 *අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම :*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.
(ii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.
(iii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේදී එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.
(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 07 ලෙසද සඳහන් කළ යුතුය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු :*

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 300 (තුන්සීයක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 500 (පන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2009.04.30 දින වේ.

6. *යෝග්‍යතා පරීක්ෂණය :*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලඝු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :*

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :

අ. පො. ස. (උ. පෙළ) සහතිකය ;
අ. පො. ස. (උ. පෙළ) z ලකුණු සඳහන් සහතිකය ;
පාසල හැරයාමේ සහතිකය ;
උප්පැන්න සහතිකය ;
නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත් :*

(ii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්වවිද්‍යාලය හැර).

(iii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

2009 අප්‍රේල් මස 08 වැනි දින,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.

SPECIMEN APPLICATION FORM

| Application for Admission to the National Diploma in Technology Course<br><br>INSTITUTE OF TECHNOLOGY, UNIVERSITY OF MORATUWA<br><br>Academic Year – 2009/2010 | *For office use only* | | | | |
|---|---|---|---|---|---|
| | Application No. | | | | |
| | District | | | | |

Application for (Please (✓))

(1) Maritime Fields - (SET 1) ☐
(2) Other Fields - (SET 2) ☐

[Applicants may apply for single set (Set 1 or Set 2) or both sets (Set 01 and Set 02)]

(Please use **BLOCK CAPITALS**)

01. PERSONAL DETAILS :

NAME IN FULL :

(Leave one blank cage between names)

NAME WITH INITIALS :

(Leave one blank cage between names)

| | | | | | |
|---|---|---|---|---|---|
| TITLE ▶ | Mr./Ms. | | SEX ▶ | Male/Female | | |
| Age: As at 31st Dec. 2008 | (Years) | (Months) | DATE OF BIRTH | Date | Month | Year |
| NATIONAL ID NUMBER | | | | | | |

02. CONTACT DETAILS :

ADDRESS (RESIDENCE):

(Leave one blank cage between different segments of the address)

| | | | |
|---|---|---|---|
| TELEPHONE | | MOBILE | |
| E-MAIL (if available) | | | |

03. RESULTS OF G. C. E. (ADVANCE LEVEL) EXAMINATION :

| *SUBJECTS & DETAILS OF EXAMINATION* | *GRADES & DETAILS OBTAINED AT THE* | | |
|---|---|---|---|
| | *1ST ATTEMPT* | *2ND ATTEMPT* | *3RD ATTEMPT* |
| *YEAR* | | | |
| PHYSICS | | | |
| CHEMISTRY | | | |
| COMBINED MATHEMATICS | | | |
| ADVANCED MATHEMATICS | | | |
| INDEX NUMBER | | | |
| Z-SCORE | . . | . . | . |
| Medium | Sinhala/Tamil/English (Delete whatever is inapplicable) | | |
| RESULTS OF THE YEAR TO BE CONSIDERED FOR SELECTION (INDICATE WHETHER) 2006 OR 2007 OR 2008) ▶ | | | |

04. SCHOOL(S) ATTENDED FROM YEAR 11 TO 13

| *YEAR* | | *NAME & ADDRESS OF SCHOOL* | *DISTRICT* | *PERIOD OF ATTENDANCE* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | *FROM* | | | *TO* | | |
| | | | | *YEAR* | *M* | *D* | *YEAR* | *M* | *D* |
| 11 | | | | | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | 1ST ATTEMPT | | | | | | | | |
| | 2ND ATTEMPT | | | | | | | | |
| | 3RD ATTEMPT | | | | | | | | |

05. CERTIFICATION OF RESULTS AND SCHOOL ATTENDED :

It is compulsory to certify the Results under No. 03 and Details under No. 04 in the application by the School Principal for the School Candidates, and by a Justice of Peace for External Candidates.

I certify that the particulars given above by the candidate in the cage No.3 and No. 4 are true and accurate according to the Original Certificates.

Name of the Principal/Justice of Peace : Rev./Dr./Mr./Mrs. ....................................................................................

Official Seal :………….

......................., .....................
Signature. Date.

06. FIELD PREFERENCE :

SET 1 - Insert order of preference as 1 for First preference and 2 for Second preference. This should be completed only by the candidates who have applied for Maritime Studies.

SET 2 - Insert order of preference as 1, 2, 3, 4, 5, 6, 7. '1' for the "Most Preferred", '2' for the next and so on '7' for the last preferred.

*SET 1*

| *MARITIME FIELDS* | *ORDER* |
|---|---|
| MARINE ENGINEERING TECHNOLOGY | |
| NAUTICAL STUDIES AND TECHNOLOGY | |

| STATE PRIORITY, IF APPLIED FOR BOTH SETS - ✓ | |
|---|---|
| SET 1 | |
| SET 2 | |

*SET 2*

| *OTHER FIELDS* | *ORDER* |
|---|---|
| CHEMICAL ENGINEERING TECHNOLOGY | |
| CIVIL ENGINEERING TECHNOLOGY | |
| ELECTRICAL ENGINEERING TECHNOLOGY | |
| ELECTRONIC & TELECOMMUNICATION ENGINEERING TECHNOLOGY | |
| MECHANICAL ENGINEERING TECHNOLOGY | |
| POLYMER TECHNOLOGY | |
| TEXTILE & CLOTHING TECHNOLOGY | |

| | | |
|---|---|---|
| Are you registered as a fulltime student in any other University under the UGC (other than Open University) or any other Higher Educational Institution under the Ministry of Education ? (Delete whatever is inapplicable) | YES | NO |

*Applicant's Declaration* :

(i) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Education.

(ii) I certify that all the particulars given by me in this Application are true and accurate. I am aware that if the particulars given by me in this Application are found to be false or inaccurate prior to my admission I will be discontinued from the course.

(iii) In the event of my being selected for admission after the Test, I shall abide by Statutes, By-Laws, Regulations and Rules of the Institute of Technology, University of Moratuwa, in so far as they are applicable to me.

(iv) I have pasted the cash deposit/ Cash transfer receipt obtained from Bank of Ceylon, drawn in favour of "Institute of Technology, University of Moratuwa - Account No. 0000308280 of Bank of Ceylon, Katubedde Branch".

(v) I also enclose a Self addressed stamped envelope (Rs. 40 worth) in size 9" x 4".

(iv) I am aware that if I am found to be registered in another University or any other Higher Educational Institution under the Ministry of Education at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

Signature of Applicant.

Date :————.

Paste your Cash Deposit/Cash Transfer Original Slip here.

04-600